**විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE)

විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත ආයතනයක් වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින්, එම ආයතනයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා, කාර්යශීලී, ප්‍රගාමී, අවශ්‍ය පරිදි සුදුසුකම්ලත් හා පළපුරුද්ද සහිත අයවලුන් බඳවා ගැනීමට අපේක්ෂා කරයි.

## නීති නිලධාරී (MM1-1, II ශ්‍රේණිය)

**සුදුසුකම් :** නීතිඥවරයකු වීම.

සමග

නීති කටයුතු පිළිබඳ වසර පහක (05) සුදුසුකම් ලැබීමෙන් පසු පළපුරුද්ද.

**වැටුප් පරිමාණය :** MM 1-1, II ශ්‍රේණිය - රුපියල් [53,175-1375X10-1910X15-95,575.00]

**වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**පොදු කොන්දේසි :**

- සේවයේ බඳවා ගැනීම, ස්ථිර පදනමින් වන අතර, තෝරාගනු ලබන අයදුම්කරුවන් මූලික වැටුප් පියවරෙහි තබනු ලැබේ.
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින්, සේවකයාගේ වැටුපෙන් සියයට පහළොවක (15%) ප්‍රමාණයකින් සේවක අර්ථසාධක අරමුදලටද, අමතරව 3% කින් සේවක භාර අරමුදලටද දායක වනු ඇත.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

ලිඛිත තරඟ විභාගයකින් ලැබෙන ප්‍රතිඵල හා පත්කිරීමේ බලධාරින් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරාගැනීම සිදුකෙරේ.

**දැනට ලබාදෙනු ලබන අනෙකුත් ප්‍රතිලාභ :**

වෛද්‍ය බිල්පත් මුදල් ප්‍රතිපූරණය, ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම, ණය මුදල් (ආපදා, වාහන) ලබාදීම, නිවාස ණය සඳහා ණය පොලිය 2/3 සඳහා ප්‍රතිපූරණය කිරීම ආයතනය විසින් සිදු කරනු ලබන අතර වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීම භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව සිදුකෙරේ.

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය :**

අයදුම්පත්, අදාළ සහතිකවල පිටපත් සමග, සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, අංක 234 ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ලිපිනයට, ලියාපදිංචි තැපෑලෙන් 2022-01-02 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත්, පුද්ගලිකව පැමිණ භාරදිය හැක. (රජයේ ආයතනවල අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානි මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුවේ.)

(අයදුම්කරනු ලබන තනතුර, අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.)

**සාමාන්‍යාධිකාරී,**

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල.**

2021-12-19

**දුරකථනය : 011-2864110**